**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු ගිණුම් /සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛනයෙ (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛනයෙ (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබව දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර **පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [**+94(0)114711411**] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබද විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **කාලීන තැන්පතු** | | | | |
| **නේෂන්ස් රයිස් තැන්පතු USD** | පළමුවැනි සහ දෙවැන්න වසර යන වසර දෙකහිම පොලී අනුපා ත වා ර්ෂිකව 5.75% ලෙස ස්ථා වරව පවතී.<br><br>ගනුදෙනුකරුවන්ට දැ න් ෙ වළඳෙපාලෙහි පවතින ෙ පාලී අනුපා ත උච්චා වචනයන්ගෙන් ප්‍රතිලා භ ලබා ගැ නීමේ හැ කියා ව පවතින අතර, ඔවුන්ට තැ න්පතුව ඇපයට තබා එහි 90% දක්වා ණයක් ෙ හා්අයිරා පහසුකම් ලබා ගැ නීමේ හැ කියා ව ඇත. | ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාම සඳහා බැංකු ගාස්තු අය නොකෙරේ.<br><br>බැංකු වෙබ් අඩවියේ පළකර ඇති බැංකුවේ ගාස්තු අනුව, ලබා ගන්නා ඕනෑම අමතර සේවාවන් සඳහා සම්මත ගාස්තු අයකරනු ලැබේ. | කාලීන තැන්පතු ගිණුම් සඳහා බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතු අතර පහත සදහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය:<br><br>• ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br><br>• ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සදහන් ලිපිනය පදිංචි ලිපිනයෙන් වෙනස් නම් ලිපින තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.<br><br>• නියාමන විදේශ මුදල් තැන්පතු විවෘත කිරීම සඳහා නියාම ආයතනය විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම අමතර ලියකියවිලි | සුදුසුකම් ලැබීමේ නිර්ණායක:<br>• PFC RFC කාණ්ඩය - ශ්‍රී ලාංකීය ජාතිකයකු වන පුද්ගලයෙක් - ශ්‍රී ලංකාවේ පදිංචි ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයින්<br>• PFC NRFC කාණ්ඩය - ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයෙක්.<br>• BFC (FEEA EFC) සෘජු අපනයනකරු කාණ්ඩය<br><br>වාසික පුද්ගලයින්<br><br>ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති තනි පුද්ගල ව්‍යාපාර හෝ හවුල්කා ව්‍යාපාර<br><br>ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්.<br><br>2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක්.<br><br>අදාළ රේඛීය අමාත්‍යාංශයේ හෝ සුදුසු අධිකාරියේ ලේකම්ගේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්.<br>* විවෘත කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට අවසර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කල්පිරීමට මත්තෙන් මුදල් ආපසු ගැනීම් සඳහා දඩ පොලී අදාළ වේ:<br><br>• වසර 2 ට අඩු කාලසීමාවන් සඳහා, අදාල අනුපාතය වනුයේ, අවසන් වරට සම්පූර්ණ කරන ලද කාලසීමාවට අදාල අනුපාතයෙන් - 1.5% ක් අඩුකිරීමෙන් ලැබෙන අනුපාතයයි<br><br>ගනුදෙනුකරුවන්ගේ කාණ්ඩ මත පදනම්ව මනාප පොලී අනුපාත ලබා දෙනු නොලැබේ.<br><br>• ස්ථාවර තැන්පතු කල්පිරීමේදී, මූලික තැන්පතුව සහ පොලිය ගනුදෙනුකරු විසින් ලිඛිතව නම් කරන ලද ගිණුමකට (විදේශ විනිමය රෙගුලාසිවලට යටත්ව) මාරු කරනු ලැබේ. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි **නේෂන්ස් රයිස් තැන්පතු USD** ගිණුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසි https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.
- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බලපැවැත්විය යුත්තේ මෙහි ඉංග්‍රීසි පිටපතයි.